**බුත්තල ප්‍රාදේශීය සභාව - 2022**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බුත්තල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බුත්තල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත .

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය තුල සෘජු ප්‍රේෂණ ලෙස ලැබී තිබුණු රු.313,241 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | සෘජු ප්‍රේෂණ සම්බන්ධයෙන් බැංකුවෙන් විමසා හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |
| (ආ) | දේශීය ණය හා සංවර්ධන අරමුදලට 2023 වර්ෂයේදී ගෙවිය යුතු රු.1,593,283 ක ණය හා පොලී මුදල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණි. | එම. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සියලුම වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය ශේෂය රු.11,992,193 ක් ලෙස දක්වා තිබුණද 2034 නොවැම්බර් දක්වා ගෙවිය යුතු ණය මුදල රු. 17,393,335 ක් විය. | එම. | එම. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන වියදම රු.12,984,131 ක් වුවත් එය මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ රු.6,130,936 ක් ලෙස දක්වා තිබුණි. | එම. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඉ) | සභාව විසින් පවත්වාගෙන යනු ලබන කර්මාන්ත ණයහිමි ලේඛනය අනුව ඔක්කම්පිටිය මහජන පුස්තකාලයේ වහලය ඉදිකිරීම වෙනුවෙන් ගොවි සංවිධානයකට ගෙවිය යුතු බවට දැක්වෙන රු.290,221 ක් සහ තවත් රු.169,020 ක ණයහිමි ශේෂ 20 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට ඇතුලත් කර නොතිබුණි. | එම. | සියලු වත්කම් වගකීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය තුළ ලද රු. 8,044,582 ක්, ඉන් දරන ලද ප්‍රාග්ධන වියදම රු. 8,311,766 ක් හා පුනරාවර්තන වියදම රු.45,000 ක් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | එම. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රධාන ලෙජරය අනුව පොදු පරිපාලන වෙනත් ආදායම් රු.3,878,545 ක් වුවද එය මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ රු. 9,436,158 ක් ලෙස දක්වා තිබුණි. | එම. | සියලු ආදායම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ලෙජරය අනුව පොදු පරිපාලන පුනරාවර්තන වියදම රු.51,103,562 ක් වුවද එය මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයට රු.58,343,857ක් ලෙස ඇතුළත් කර තිබුණි. | එම. | සියලු ආදායම් වියදම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂය තුල වැඩ අවසන් කරන ලද රු.799,854 ක් වටිනා කර්මාන්ත 02 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | එම | සභාව සතු සියලු වත්කම් වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් ජලමනු 50 ක් මිලදී ගැනීම සඳහා වැයකරන ලද රු.799,500 ක් දේපල පිරියත උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | එම | එම |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ රු. 328,000 ක් සහ මුද්දර ගාස්තු රු.1,057,127ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | එම | සියලු ආදායම් වියදම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු රු. 4,523,081 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ රු.2,501,813 ක් ලෙස දක්වා තිබුණි. | එම | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ක) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය තොගය රු.309,154ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු. 237,259 ක් ලෙස දක්වා තිබුණි. | එම | අවසන් තොගයේ වටිනාකම නිවැරදිව ගණනය කළ යුතුය. |
| (ග) | සුසාන භූමි 04 ක තක්සේරු වටිනාකම වූ රු.12,400,000 ක් ගිණුම්ගතකර නොතිබුණු අතර ඉඩම් 11 ක් සහ ගොඩනැගිලි 07 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි | එම | සභාව සතු සියළු වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ච) | බාහිර පාර්ශවයන් විසින් ප්‍රාදේශීය සභාවට එරෙහිව පවරන ලද නඩු 02 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | එම | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කිරීම් නිවැරදිව සිදුකළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම් හා උපලේඛනවල දක්වා ඇති වටිනාකම් සැසඳීමේදි රු.1,566,813ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශනවල හා උපලේඛන වල දක්වා ඇති වටිනාකම් වල ඇති වෙනස නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | ලේඛන හා උපලේඛන නිවැරදිව යාවත්කාලීනකර නොසැසඳීම්වලට හේතු සොයා නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතු වටිනාකම රු. 309,199,670 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි ශේෂය සම්බන්ධයෙන් වෘත්තීය තක්සේරුකරුවන්ගේ වාර්තා, සහ හිමිකම් ඔප්පු ඉදිරිපත් කර නොතිබුණු බැවින් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ප්‍රාදේශීය සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සඳහා විධිමත් තක්සේරුවක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් වෘත්තීය තක්සේරුකරුවන් ලවා තක්සේරු කරවාගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1987 අංක 15 දරන | | | |
| (i) | ප්‍රාදේශීය සභා පනත 19 (xii) වගන්තිය | සභාව සතු කඩකාමර 15 ක් වසර 30 කට බදු දී තිබුණු අතර ඊට අදාලව විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මෙම දීර්ඝකාලීන බදු දීමට අදාලව අනුමැතිය ලබා දෙන මෙන් විෂයභාර අමාත්‍යතුමාගෙන් ඉල්ලීම් කර තිබුණද ඒ සඳහා අනුමැතිය ලබාදී නොමැත. | දීර්ඝ කාලීනව බදු දීමට අදාලව විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ii) | 24(1)(අ) වගන්තිය | සභාවට අයත් මංමාවත් 202 ක් ගැසට් පත්‍රයේ පල කර නොතිබුණි. | හඳුනාගත් පොදු පාරවල් හා මංමාවත් සිතියම් ගතකර ගැසට් පත්‍රයේ පලකිරීමට අදාල කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කර ගැසට් පත්‍රයේ පලකළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 571 | තැන්පත් ගිණුම්වල පැවති වර්ෂ 02 ක ඉක්ම වූ රු. 1,341,723 ක තැන්පත් ශේෂ 29 ක් නියාදනය කර නොතිබුණි. | කර්මාන්ත අතරුඳවුම් මුදල් නිදහස් කරගන්නා ලෙස අදාල සංවිධාන වෙත ලිපි මගින් දැනුම් දී ඇති අතර නිදහස් කර නොගන්නා තැන්පත් මුදල් 2023 වර්ෂයේ ආදායමට ගැනීමට අපේක්ෂා කරමි. | වර්ෂ 02 ඉක්ම වූ පොදු තැන්පත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුයි. |
| (ඇ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය | සභාව විසින් වීථි පහන් 638 ක් සවිකර තිබුණද වීථි ආලෝකකරණය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වී නොතිබුණි. | විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වමි. | චක්‍රලේඛය පරිදි ගිවිසුම්ගතවීමට කටයුතු කළ යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,098,689 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,618,055 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,191,067 | 2,183,916 | 2,247,344 | - | 2,191,067 | 2,183,916 | 1,677,199 | 506,717 |
| කුලී | 6,604,400 | 9,734,116 | 6,242,250 | 3,491,866 | 6,503,500 | 6,706,532 | 4,634,882 | 2,071,650 |
| බලපත්‍ර ගාස්තු | 2,000,000 | 1,956,545 | 1,956,545 | - | 1,486,000 | 4,117,854 | 4,117,854 | - |
| වෙනත් ආදායම් | 14,374,000 | 24,637,080 | 14,733,051 | 9,903,129 | 35,824,600 | 24,637,081 | 17,959,389 | 6,677,692 |
| එකතුව | 25,169,467 | 38,511,657 | 25,179,190 | 13,394,995 | 46,005,167 | 37,645,383 | 28,389,324 | 9,256,059 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද මුළු ආදායම රු. 38,511,657 ක් වුවද වර්ෂය අවසාන වන විට එයින් රු.13,394,995 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල්කල ආදායමෙන් සියයට 35 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගන්නා බව කාරුණිකව දන්වමි. | සභාව විසින් බිල් කරන ලද ආදායම් අයකරගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.10,000 ට වැඩි වරිපනම් බදු ඒකක 26 කින් අයවිය යුතු රු.764,630 ක හිඟ මුදල අයකරගෙන නොතිබුණි. | හිඟ වරිපනම් බදු ඒකකවලින් ඉදිරියේදී මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ වරිපනම් බදු අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1988 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සභාව සතු සතිපොල, මස් කඩ හා මාළු කඩ ඇතුළු දේපල 06 ක් බදුදීම වෙනුවෙන් අයවිය යුතුව පවතින රු. 1,864,472 ක කුලී ආදායම් අයකර ගෙන නොතිබුණි. | 1988 සිට 2012 දක්වා හිඟ මුදල් අයකර ගැනීමට නඩු ගොණුකර ඇතත් බදුකරුවන් සොයා ගැනීමට නොහැකි වී ඇති බවත් 2019 වර්ෂයේ හිඟ අයකර ගැනීමට නඩු ගොණු කිරීම සඳහා නීතිඥවරුන්ට භාර දී ඇති බවත් දන්වමි. | හිඟ බදුකුලී ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඈ) | සභාවට අයත්ව තිබුණු කඩා ඉවත් කරන ලද පැරණි කඩ කාමර 14 කින් අයවිය යුතුව තිබුණු කඩ කාමර කුලී රු.181,599 ක් 2023 පෙබරවාරි 21 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | මෙම හිඟ මුදල් අයකර ගැනීම සඳහා අදාළ කඩ හිමියන් වෙත හිඟ මුදල් ගෙවන ලෙස දන්වා හිඟ නිවේදන යොමු කර ඇති අතර කඩිනමින් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | හිඟ කඩ කාමර කුලී කඩිනමින් බදු අයකරගත යුතුය. |
| (ඉ) | සභා බලප්‍රදේශයේ ස්ථාපිත කර තිබුණු ආයතන 3 කට අයත් දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 07 කින් 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අයවිය යුතු රු.174,000 ක මුදලක් අයකරගෙන නොතිබුණි. | දුරකථන සම්ප්‍රේෂණ කුළුණුවලින් හිඟ දුරකතන ගාස්තු අයකිරීම සඳහා හිඟ නිවේදන ලිපි ,අදාල පෞද්ගලික ආයතන වෙත යවා ඇති බවත් කුළුණු සඳහා අයවිය යුතු හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට අපේක්ෂිත බවත් දන්වමි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජල පාරිභෝගිකයින් 968 ක ගෙන් අයවිය යුතු රු. 449,787 ක හිඟ ජල ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ ජල ගාස්තු ආදායම් ඉදිරියේදී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (උ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 104,680 ක් සහ මුද්දර ගාස්තු රු. 2,407,812 ක් ගෙන්වාගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | හිඟ ආදායම් කඩිනමින් ගෙන්වාගත යුතුයි. |

**2.3** අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශිය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂවලදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.696,241ක මුදලක් අයකර ගත යුතුව තිබුණි. | වගකිවයුතු පාර්ශවයන්ගෙන් අධිභාර අයකර ගැනීමට කටයුතු කරමින් සිටින බව දන්වා සිටිමි. | පනවා ඇති අධිභාරයන් වගකිවයුතු පාර්ශවයන්ගෙන් කඩිනමින් අයකරගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බුත්තල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ හඳුනාගත් ස්ථානවල රථවාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීමට අංක 2256 දරන 2021 නොවැම්බර් 26 දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර තිබුණද, 2023 පෙබරවාරි 21 වන දින වන විට සභා බලප්‍රදේශයේ හඳුනාගෙන තිබුණු රථවාහන නැවතුම් ස්ථාන 9 කින් ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | රථ වාහන නැවතුම් ස්ථානවලින් මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | හඳුනාගත් රථවාහන නැවතුම් ස්ථානවලින් ගාස්තු අයකළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයකින් 2022 ජුලි 14 දින වටිනාකම රු.64,000 ක ඩීසල් ලීටර් 161.9 ක් අවිධිමත් ලෙස බැහැර කර තිබුණු අතර 2023 පෙබරවාරි 21 දින වන විටත් ඒ සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන එම මුදල අයකරගෙන නොතිබුණි. | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ ඉන්ධන අස්ථානගත වීම සම්බන්ධයෙන් බුත්තල පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කල අතර , ඒ පිළිබඳව විමර්ශන කටයුතු සිදුවෙමින් පවතී. | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීම් සිදුකළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් බදු අයකිරීමට අදාලව 2004 වර්ෂයේදී අවසන් වරට දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන තිබුණු අතර කාලීනව දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වසරේ දී දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව සඳහන් කරමි. | කාලීනව දියුණුකළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වරිපනම් බදු අයකිරීමට අදාල දේපල 2007 වර්ෂයේ අවසන්වරට තක්සේරු කර තිබුණු අතර කාලීනව තක්සේරුකිරීම් සිදුකර නොතිබුණි. | 2016 වසරේ දී වරිපනම් බදු අයකිරීමට අදාල දේපල කාලීනව තක්සේරු කර ඇති බව දන්වා සිටින අතර 2023 වර්ෂයේ සිට එය ක්‍රියාත්මක කරමින් පවතින බව දන්වමි. | වරිපනම් බදු අයකිරීමට අදාල දේපල කාලීනව තක්සේරු කළ යුතුය. |
| (ඇ) | සභාව විසින් දීර්ඝකාලීනව බදු දී තිබුණු කඩ කාමර 67 ක මාසික බදු කුලිය අය කිරීමේදී, ඌව පළාත් ප්‍රධාන තක්සේරුකරුගේ අංක එම්ඕ/ආර්ඩී/498 දරන 2018 ජුලි 24 දිනැති තක්සේරුව අනුව කටයුතු කර නොතිබුණු බැවින් 2022 දෙසැම්බර් 31 දින වන විට සභා අරමුදලට රු.24,687,400 ක ආදායමක් අහිමි වී තිබුණි. | තක්සේරුවට පෙර අයකරමින් තිබූ කඩ කුලිය කඩකාමර 67 න් අය කරන ලෙස ඌව පළාත් ආණ්ඩුකාරතුමාගේ වාචික උපදෙස් හා ලිඛිත සටහන අනුව අය කරන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමාගේ අංක 1/1/4/4/12 හා 2021 ජනවාරි 05 දිනැති ලිපිය මගින් දන්වා ඇත. | තක්සේරු පනතට අනුව කටයුතු කර අදාල තක්සේරුව අනුව අයකිරීම් සිදුකළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් ඉඩම් 52 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | අප ආයතනය විසින් භුක්ති විඳින ලද දේපළ පැවරුම් නියෝග මඟින් පවරා ගැනීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර එය කඩිනමින් කර ගැනීම සඳහා බුත්තල ප්‍රාදේශීය ලේකම් තුමන් වෙත 2022 දෙසැම්බර් 20 දිනැති ලිපිය මඟින් නැවත දන්වා යවා ඇත. | සභාවට අයත් ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුය. |
| (ආ) | සභාවට අයත් වාහන හා යන්ත්‍රෝපකරණ කුලියටදීම වෙනුවෙන් 2010 - 2022 කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු රු. 8,746,725 ක හිඟ කුලී ආදායම් අයකරගෙන නොතිබුණි. | පසුගිය වසරවලට අදාල හිඟ කුලී ආදායම් මේ වන විට අයකර ගැනීම් සිදුකර ගනිමින් පවතින අතර ඉතිරි හිඟ මුදල්ද ඉදිරියේදී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුයි. |
| (ඇ) | සභාව විසින් භාවිතා කරන වාහන 02 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. . | මිණි ට්‍රැක්ටරය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සතුව පවතින අතර , අලුත්වැඩියා කටයුතු සිදුකර නීත්‍යානුකූලව සභාව වෙත පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. එමෙන්ම මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය බුත්තල ප්‍රාදේශීය සභාවට පරිත්‍යාගයක් වශයෙන් ලැබුණු අතර ,එයට අදාල ලියවිලි කිසිවක් නොමැති බැවින් මෙම යන්ත්‍රය සඳහා මෙතෙක් මුල් අයිතිකරුවෙක් සොයා ගැනීමට නොහැකි වීම තුල අදාල කාර්යය සිදුකර ගැනීමට නොහැකි විය. | සභාව සතු වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාර්ග ගුවල් කිරීමේ ව්‍යාපෘති 03 කට අදාලව ලුණුගල කොළණියේ ගුවල් ලබා ගන්නා ස්ථානයේ සිට සංවර්ධනය කරන මාර්ගය දක්වා ගුවල් ප්‍රවාහනය කිරීම සඳහා පවතින දුර වැඩිපුර දැක්වීම හේතුවෙන් රු. 111,974 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල සම්බන්ධව පරීක්ෂා කර ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි. | නිවැරදිව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුයි. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවය කළ සේවකයින් 21 දෙනෙකුට ලබාදී තිබුණු වර්ෂ 1 කට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින රු.112,569 ක ණය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. | එම හිඟ ණය මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම් වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් පවතින බැවින් ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි . | ඉදිරියේදී නිසි පරිදි වාර්ෂික අයවැය සකස් කිරීමට පියවර ගන්නා බව දැනුම් දෙමි. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු වඩාත් තාත්විකව පිළියෙල කළ යුතු අතර එම ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතුයි. |